භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

ඇබෑර්තු

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපිත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) - MM 1-1 - තනතුරු 01
02. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - MM 1-1 - තනතුරු 01
03. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) - MM 1-1 - තනතුරු 01
04. සහකාර අධ්‍යක්ෂ (නීති) - MM 1-1 - තනතුරු 04
05. සහකාර අධ්‍යක්ෂ (පරිසර බලපෑම් තක්සේරු හා ප්‍රදේශ) - MM 1-1 - තනතුරු 01
06. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) - MM 1-1 - තනතුරු 01
07. භූ විද්‍යාඥ - MM 1-1 - තනතුරු 03
08. අභ්‍යන්තර විගණක - MM 1-1 - තනතුරු 01
09. පර්යේෂණ සහකාර - MA 2-2 - තනතුරු 02

1. සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්)
2. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

බාහිර අයදුම්කරුවන් :

අධ්‍යාපන සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් මානව සම්පත්/ කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන/ වාණිජ්‍ය ක්ෂේත්‍රයේ උපාධියක් ලබාතිබීම.

සහ

සේවා පළපුරුද්ද :

2. උපාධිය ලබාගැනීමෙන් පසුව, මානව සම්පත්/ පරිපාලන/ කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපන සුදුසුකම් :

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. මානව සම්පත්/ පරිපාලන ක්ෂේත්‍රයේ "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

3. සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)

බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් වාණිජ්‍ය/ ගණකාධිකරණ උපාධියක්.
2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ගිණුම්කරණ/ මූල්‍ය ක්ෂේත්‍රයේ අන්තර්මධ්‍ය විභාගය සමත්වීම

සහ

සේවා පළපුරුද්ද :

1. ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, ගිණුම්කරණ/ මූල්‍ය ක්ෂේත්‍රයේ තනතුරට අදාළව අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත (1 හෝ 2) සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. තනතුරට අදාළව ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රයන්හි "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

4. සහකාර අධ්‍යක්ෂ (නීති)

බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් නීති (LLB) උපාධියක්.
2. නීතිඥවරයෙකු වීම.

සේවා පළපුරුද්ද :

3. ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, ආයතනික පරිපාලන/ නීති කටයුතුවල යෙදීම ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) ක පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපන සුදුසුකම් :

1. ඉහත (1 හෝ 2) සඳහන් බාහිර අයදුම්කරුවන්ගෙන් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. තනතුරට අදාළව, නීති කටයුතු ක්ෂේත්‍රයේ, "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

5. සහකාර අධ්‍යක්ෂ (පාරිසරික බලපෑම් ඇගයීම් හා ප්‍රාදේශීය)

බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2 හා 3)

අධ්‍යාපනික සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් පතල් ඇතුළු හා ඛනිජ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, භූමි සම්පත් ඉංජිනේරු විද්‍යා උපාධියක්

සහ

සේවා පළපුරුද්ද :

3. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු, පාරිසරික බලපෑම් ඇගයීම් හා ප්‍රාදේශීය පරිපාලන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික සුදුසුකම් :

1. ඉහත (1 හෝ 2) හි සඳහන්, බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. පාරිසරික බලපෑම් ඇගයීම් හා ප්‍රාදේශීය පරිපාලන ක්ෂේත්‍රයේ "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

6. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)

බාහිර අයදුම්කරුවන් : (පහත 1 හා 2)

අධ්‍යාපන සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ පරිගණක විද්‍යා (විශේෂ) ප්‍රථම විද්‍යා උපාධියක්

සේවා පළපුරුද්ද :

1. ප්‍රථම උපාධිය ලබාගත් පසු, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික සුදුසුකම් :

1. ඉහත (1 හා 2) හි සඳහන්, බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

7. භූ විද්‍යාඥ

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපනික සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් රසායන විද්‍යා/ භෞතික විද්‍යා/ පරිගණක විද්‍යා/ ජීව විද්‍යා යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමගින් භූ විද්‍යා (1 හෝ 2 වන පංතිය) (විශේෂ) විද්‍යා උපාධියක් ලබා තිබීම

සහ

සේවා පළපුරුද්ද :

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, භූ විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික සුදුසුකම් :

1. ඉහත සඳහන් කොට ඇති, බාහිර අයදුම්කරුවන් සඳහා වූ සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. තනතුරට අදාළව භූ විද්‍යා ක්ෂේත්‍රයේ "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද.

8. අභ්‍යන්තර විගණක

බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් වාණිජ්‍ය/ ගණකාධිකරණ උපාධියක්

සහ

සේවා පළපුරුද්ද :

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව, තනතුරට අදාළව, විගණන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

2. තනතුරට අදාළව විගණන/ ගිණුම්කරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය පරීක්ෂණය සමත්වීම

සහ

සේවා පළපුරුද්ද :

තනතුරට අදාළව විගණන ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

අධ්‍යාපනික සුදුසුකම් :

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

සේවා පළපුරුද්ද :

2. තනතුරට අදාළව විගණන ක්ෂේත්‍රයේ "කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ" (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

වැටුප් පරිමාණය, අංක 03/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වේ.

MM 1-1 රුපියල් 53,175 - 10X1,375 - 13X1,980 - 98,375+ජීවන වියදම් සහ දීමනාව

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම වයස් සීමාව අදාළ නොවේ.

9. පර්යේෂණ සහකාර

බාහිර අයදුම්කරුවන්

වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් නිකුත් කළ, පර්යේෂණ කාර්ය ක්ෂේත්‍රයට අදාළ, NVQ පහ (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

වෘත්තීය සුදුසුකම් :

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

වැටුප් පරිමාණය, අංක 03/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වේ.

MA 2-2 රුපියල් 30,310 - 10X1,300 - 07X350 - 04X600 - 20X710 - 52,300 + ජීවන වියදම් දීමනාව

වයස් සීමාව :

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම වයස් සීමාව අදාළ නොවේ.

තනතුරුවලට අදාළ පොදු කොන්දේසි :

- තෝරාගත් අයදුම්කරුවන් විසින් තම වැටුපෙන් 10% ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, කාර්යාංශය විසින් 15% කින් දායකත්වය දරයි. තවද, කාර්යාංශය විසින් 3% ප්‍රමාණයකින් සේවක භාර අරමුදලට (ETF) දායකත්වයක් ලබා දේ.
- රෝහල් ගෙවීම්, රක්ෂණ යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
- බාහිර රෝගී ගෙවීම්, උපදෙස් සඳහා ප්‍රතිපූර්ණයට හිමිකම් ඇත.
- රාජ්‍ය සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- අයදුම්කරු සම්බන්ධයෙන් විස්තර ලබා ගැනීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් හා දුරකථන අංක අදාළ අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.
- අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල ඡායාපිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය.

අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **අයදුම් කරනු ලබන තනතුර** සඳහන් කළ යුතුය. අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2020-05-09 දිනට පෙර, ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,
අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.